# උණු වන ඔසී හදවත සහ අග්‍රාමාත්‍ය ප්‍රගති වාර්තාව.




සුදු ඔසී හදවත වනාහි වෙඬරු වාගේ පහසුවෙන්ම උණු වන - දිය වන - සුමුදු අවයවයකි. මේ රටේ ඉතා ජනප්‍රිය අගමැතිවරයකු වූ රොබර්ට් ජේම්ස් ලී හෝක් වේදිකාව මත දෑසින් පෙරන කඳුළු සහිතව කතා කළා තවමත් රටවැසියන්ට මතකය. ඒ තියනමන් චතුරශ්‍රයේ සිදුවූ ඝාතනයෙන් සිය ගණනක් චීන ජාතිකයන් මිය ගිය අවස්ථාවේදීය.

හෝක් අඬලා නිකම් හිටියේ නැත. දහස් ගණනින් අනාථ වූ චීන පුරවැසියන් දරුකමට හදා ගන්ට ගෙන්වා ගත්තේය.

දැන් හෝක් චරිතය වඩාත් ලස්සනට රඟපාන නිළියක් ඇත . උත්තර මන්ත්‍රී සේරා හැන්සක් ය. පසුගිය දාක ඇය කඳුළු සැලුවේ උත්තර මන්ත්‍රි සභා ගර්භය තුළ දීමය. පිළිසරණ සොයා ගෙන තම රටට එන්නට තැත් කරන අසරණයන්ගේ දුක දැකලාය.

ඔය දෙන්නා තබා අන්කිසි දේශපාලකයෙක් සිය රටේ (මව් බිමේ යයි මා නොකියන්නේ ඒ වැඩි දෙනාට තවමත් මව් බිම එංගලන්තය වන හෙයිනි. අපට ශ්‍රී ලංකාව මව් බිම වන්නාක් මෙනි) සතා සීපාවුන් හා ගහ කොළ සමග වසර පනස් දහසක් පමණ ජීවත් වූ ස්වදේශිකයන්ග් දුක අසා කිසි දාක කඳුලක නොහෙළති.

ඉරාකයේ සදාම් හුසේන් යටතේ ඒ රටේ පුරවැසියන්ට වන අතවර දැක ජෝර්ජ් බුෂ් වාගේම කම්පාවට පත් වූ අගමැති ජෝන් හොවාර්ඩ් හුසේන් මර්දනය සඳහා සම්මාදම් වී මෙරට තරුණ ජීවිත සිය ගණනක් මිනිස් අයිතිවාසිකම් වෙනුවෙන් පූජා කළේ ය. ඒ වාගේම පුණ්‍ය කර්මයකට ඇෆ්ඝනිස්ථානයේද තවමත් අත ගසා ගෙන සිටින්නේ ඔහුගේ අනුප්‍රාප්තිකයන්ය.

ඔය තරමටම උණු වන ඔසී හදවත ගල් වන දර්ශනයක් ඇත . ඒ තමන් පදිංචියට ආපු රටේ බීමට ඇබ්බැහි වූ කළු මිනිසුන් ගේ දුකය. අසරණකමය. කළු මිනිසා හීලෑ කරගෙන තමාට රිසි පරිදි හසුරුවාලිය හැකි තත්වයකට ඔවුන් පත්කිරීමේ මහඟු කාරිය සාර්ථක අයුරින් ඉටු කළ පාලකයෝ ඔවුන් තමාට සමාන පුරවැසියන් බවට පත් කිරීමේ පින්කමට අත ගසන්නේ රටට පෙන්වන්නට පමණි.

මුළු ලොවම සතුටු කළ යුතු යයි සිතා කොමිසමක් දෙකක් පත් කිරීම ඔවුන්ගේ දැවැන්ත කාර්යයි. පටන්ගැන්මට පත් කරන ලද පොලිස් අත්අඩංගුවට ගත් පසු මිය ගියවුන් පිළිබඳ කොමිසමේ වාර්තාව පිට වී දැනට දශක ගණනාවක් ගත වී ඇත . තත්වය තිබුණාටත් වඩා උග්‍රය. තවම ඒ ගැන කතා බහ කරන එක අත්ඇරලා නැත .

කළු දරුවන් පැහැර ගෙන යාම ගැන විමසීමටද කොමිසමක් පත් කරන ලදී . ඒ වාර්තාව ඉදිරිපත් කරන ලද අවස්ථාවේ අගමැති ජෝන් හොවාර්ඩ් මෙල්බර්න් සම්මන්ත්‍රන ශාලාව තුළ රඟ පෑ දර්ශනය ඉතිහාසය දන්නා අයට මතකය. ඒ වාර්තාවට අනුව පමා වී වුව ද 2009 පෙබරවාරියේදී අගමැති කෙවින් රඩ් විසින් ඕස්ට්‍රේලියානු පාර්ලිමේන්තුව තුළ දී ආදිවාසී ජනයාගෙන් සමාව ඉල්ලන ලදී . එය ඉතා දුක්බර හා සතුටුදායක අවස්ථාවකි.

උතුරු පෙදෙස් ආදිවාසී දරුවන් අපයෝජනයට හා මත්පැනට ගොදුරුවීම වළක්වනු වස් හොවාර්ඩ් මැදිහත් වීමේ ව්‍යාපාරයක් දියත් කළේය. සද්ද බද්ද කර පටන් ගත්තත් නටාපු තොයිලයක් නැති තරම්ය.

ආදිවාසී ඕස්ට්‍රේලියානුවෝ හැම අතකින්ම සෙසු පුරවැසියන්ට වඩා අන්ත තත්වයකට වැටී සිටින්නෝය. ආයුෂ ප්‍රමාණය - සෞඛ්‍ය තත්වය - පහසුකම් - වාසස්ථාන පහසුව - අධ්‍යාපනය - රැකියා පහසුකම් - මත් ද්‍රව්‍ය වලට ගොදුරුවීම - ළමා අපයෝජනය යන මේ කුමන අංශයකින් වුව ද තුන් වන ලෝකයේ කිසිම රටක වැසියාට වඩා පහත් තත්වයක සිටින ආදිවාසීන් තවමත් එතැනමය. කොමිසම් - පොරොන්දු - උපදේශක සභා - යන මේ සකල විධ ප්‍රයත්නම අසාර්ථක වූයේ ඇයි.?

උත්තරයක් නැත .

අපි ආදිවාසී ජනතාව වෙනුවෙන් ඇප කැප වී සිටින්නෙමුයි උදම් අනන කම්කරු පක්ෂය යටතේ ලද දියුණුවක් නැතැයි පසුගියදා අග්‍රාමාත්‍ය ටෝනි ඇබට් විසින් ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාව පෙන්වා දුන්නේය.

මුළු ලොවට දුගී දුප්පත් ජනතාව වෙනුවෙන් කඳුළු හෙළූ සුපින්වත් නායක නායිකාවන්ට මේ දුක නැවතත් පෙනේවා, ඔවුන්ට ඒ දුක නිවීමේ මගක් සොයා ගැනීමේ හැකියාව ලැබේවා, ඔවුන් කරුණාබර නේත්‍ර යුග්මය මේ දේශයේ වාසය කැන කළු ජාතිකයන් වෙත යොමු කිරීමට හිතක් පහළ වේවා, යනුවෙන් පතනවා හැර අප වැන්නන්ට කළ හැකි දෙයක් නැත .



ADVICE ON LEGAL MATTERS

**Business & Commercial Law**
Sale & Purchase of Busines | Leases | Franchises

**Conveyancing**
**Residential, Commercial & Rural**
Sale & Purchase | Vendor Statements
Auction Contracts | Contract of Sales
Subdivisions

**Probate & Testamentary**
Wills | Power of Attorney
(Foreign, Special, Enduring & Medical)
Deceased Estates & Administration

**Family Law**
Divorce | Consent Orders
Property Settlements | Binding Financial Agreements

**Migration Law**
General Skilled | ENS/RMS
Spouse | Contributory Parents
Visitor......etc

GATEWAY
LAWYERS

**Senanie Kurukularatne**
**Barrister & Solicitor**
Director-Principal
Attorney-at-Law Sri Lanka
Registered Migration Agent
MARN 0854193

**GATEWAY LAWYERS (AUSTRALIA) PTY LTD**
PO Box 730 Berwick VIC 3806 Australia
DX 30463 Berwick VIC 3806 Australia
**17 Glenview Rise Berwick VIC 3806 Australia**

**Tel** +61 3 8786 9682
**Fax** +61 3 8786 9681
**Mobile** +61 414 660 513

info@gatewaylawyers.com.au
www.gatewaylawyers.com.au